UNEDITED SAMPLE PAGE

ගලීනා ඩෙමිකිනා

## පළමුවෙනි පරිච්ඡේදය

# සියල්ල ඇරඹුණේ ඉතා චාම්වය

සෝයාත්, ඇගේ මවත්, ජනිනා නැන්දාත් අලුත් තට්ටු නිවාසයකට පදිංචියට ආහ. හැමට ම කලියෙන් මේ අය කළේ ගේ ඇතුළට බළලෙකුව රිංගවීම ය. එසේ කරන්නට කීවේ කලිං ගෙදර ළඟ හිටපු මහලු කාන්තාවයි. ඈ කීවේ එයින් වාසනාව අත් වෙන බවයි. ඉතිං මේ බළලාව දුන්නේත් ඇය ම යි.

"ඔයගොල්ලෝ මේ පූසව හදාගන්න" ඈ එසේ කී විට අම්මා කීවේ "මෙච්චර කදිම පූසෙකුව අපිට බලා කියා ගන්න බැරි වේවි" කියා ය.

එහෙත් අසල්වැසි කාන්තාව බලකර ඉල්ලා සිටියා ය.

"ඔය ගොල්ලෝ උගේ ඔය හපාකෑව කන ගැන එච්චර හිතන්න ඕන නෑ. ඕක ඔය බළල් රණ්ඩුවකදි වෙන එකෙක් හපා කාලා තියෙන්නේ. ඇත්ත වශයෙන්ම... ඒකා ඒකා බොහෝම වටිනවා."

අලුත් නිවාසයේ දොර විවර කළ විගසින් ම මේ වටිනා කියන බළලා කළේ කුස්සියට වැදී ගැනීම ය. ගෑස් උදුන පිටිපස්සේ උෟ බියගුළු විදිහට හැංගී ගත්තේ ය. එතැන සිටීම උෟට වඩාත් අමාරු වෙන්නට ඇත. කලිං අයිතිකාරියට කැමති උෟ සෝයාලාට කොහොමටවත් යටත් වූයේ නැත. කකුල් ගස්සමින් උෟ ඇති කළේ හරිම ගාල ගෝට්ටියකි. බළලාගේ මේ සෝෂාකාරී විරෝධයට හරියන තරමට ම එදා ගෙදරත් මහා සද්ද බද්ද වලින් පිරුණි.

ගෙදර අලුත් නිවැසියෝ ලොකු කුඩා බඩු භාණ්ඩ රැගෙන ආහ... ඒවා බොහෝ පිළිවෙළට තැබූහ... ජනෙල් තිර, කණ්නාඩි, පින්තූර එල්ලන්න බිත්තිවලට ඇණ තියලා තඩිබෑහ... ඒ නම් හරි ම රළු පරළු මහා සෝෂාකාරී වැඩකි. එහෙත් ඉතිං අම්මා ඒ සියල්ල බාර ගෙන කළා ය.

ලොකු ම පින්තූරේ අම්මා ඇගේ ම කාමරේ එල්ලූවාය. කලිං ගෙදරදීත් එය තිබුණේ අම්මගේ කාමරේ ම ය. ජනිනා නැන්දා

UNEDITED SAMPLE PAGE



කාට හෝ එය පෙන්වද්දී බොහෝ ම මෘදු ලෙස, ගරුසරුව මෙසේ කියන්නී ය.

"ඒක ටඩෙවුස්ගේ චිත්‍රයක්."

පින්තූරයේ ඇත්තේ කොළපාට පඳුරකි. එය සාරවත්ව හැදිලා ය, එය බොහෝ වේගවත්ව වැටට උඩින් දුවන්නට හදයි. සුළඟින් ඇද වැටුණු වැට කණු කුරුම්ණි ගුල්වලින් පුල්ලි ගැසීගෙන ය. ඒවා පණුවන් වාගේ ය. වැට අද්දරින් ඇඳුණු අඩි පාරක් පින්තූරයේ රාමුව දක්වා ඇදී ගියේ ය. මේ පාර හොඳින් පෑගුණු එකකි. කවුරුන් හෝ මේ පාර සමතලා වන තුරු ඇවිද තිබුණි. මේ අඩි පාර දිගේ ඇවිද යන්නටත්, හිරු රැසින් උණුසුම් වුණු වැටට පිටදී හිඳගෙන සිටින්නටත්, පඳුරෙහි විසිරෙන අතු පතරෙහි සහ තණකොළවල පුසුඹ උරන්නටත් සෝයා මහත් සේ ආශා කළා ය. වැට පිටුපසින් දිළිසෙමින් තිබෙන්නේ කුමක්දැයි බලන්නටත් ඇයට ඕනෑ විය. එය සුදු පැහැති දෙයකි. ඒත් එය කොහෙත් ම පැහැදිළිව පෙනෙන්නේ නැත.



UNEDITED SAMPLE PAGE



සෝයාගේ කාමරයෙන් පැමිණෙන්නේ කිසිවකට තඩිබාන හඬකි. සෝයාගේ පින්තූර එල්ලීමට අම්මා බිත්තියට ඇණ ගසන්නී ය. අම්මා සිතන්නේ මේ පුංචි චිත්‍ර වටකොට සිටීමෙන් තම දියණිය ප්‍රීතිමත් වනු ඇතැයි කියා ය. එහෙත් සෝයා ඒ සියල්ල ම වුව අම්මාගේ කාමරයේ ඇති පින්තූරයට මාරු කර ගන්නට මහත් සේ කැමති වනු ඇත.

"සෝයා ඇවිත් මට පොඩ්ඩක් උදව් වෙන්න"

සෝයා එසේ කළා ය.

"මේසය උඩ තියෙන පින්තූර ටික අරන් දෙන්න. මට ඒවට අත දිග නෑ"

සෝයා ඒවා රැගෙන දුන්නා ය.

"අම්මේ, මම මේ පින්තූර ඔක්කෝම ටික අහක දානවා ඔයාගේ පින්තූරේ මට දෙනවා නං" ඈ සුසුම් ලෑවා ය.

අම්මාට හොඳටම හිනා ගියේ ය. ඒත් ඈ දත්වලින් ඇණයක් හිර කරගෙන හිටි නිසාවෙන් කටින් පිටවුණේ අමුතු හඬකි.

"ෆී...ෆී...ෆී...ෆ"

ඇණය අතට ගත් අම්මා මඳ සිනා පෑවා ය.

"මං සහතිකේටම දන්නවා ඔයා එහෙම කරනවා කියලා. ඇත්තට ම ටඩෙවුස් මාමා අපේ බොහෝ ම දුර නෑයෙක්. එයා ජනප්‍රිය ඒ වගේ ම ඉතා ම කදිම චිත්‍ර ශිල්පියෙක්. එයාගෙ සහජ හැකියාව ම තමා ඔයාට පිහිටලා ඇත්තේ."

"මොකක්ද අම්මේ සහජ හැකියාව කියන්නේ?"

"ඒ තමයි උපන්ගෙයි දක්ෂකම."

සෝයාට එය තේරුණේ නැත. ඇය මඳක් නිහඬව කල්පනාවට වැටුණි. ඉන්පසු යළිත් ප්‍රශ්න කළාය.

"එතකොට මොකක්ද අම්මේ උපන්ගෙයි දක්ෂකම කියන්නේ?"

"ඒ සහජ හැකියාව" කල්පනා නොකර ම අම්මා කීවා ය.

"ඒ මොකක්ද?" සෝයාට සියල්ල ම පටලැවුමකි.

"ඒක තමා ස්වභාව ධර්මයෙන් ලැබෙන දේ."

"එතකොට මොකක්ද?"

"මොකක්ද?"

UNEDITED SAMPLE PAGE



"ටඩෙවුස් මාමගෙන් මට ලැබුණය කිව්වේ?"

"ඒ තමා ඔයාට හොඳින් අඳින්ට පුළුවන් කම."

මෙවිට සෝයාට දැනුණේ මහත් හිස් බවකි. ඒ කියන්නේ අම්මා තමා අඳින චිත්‍රවලට කැමති නැතිද?

"ඔයා ඔය දැන් කීවේ මට රිද්දවන්න. සහජ හැකියාව කියන්නේ උපන්ගෙයි දක්ෂකමට, එතකොට උපන්ගෙයි දක්ෂකම කියන්නේ සහජ හැකියාවටද? එහෙමද? මුලින් ඒක මට ලැබෙනවා කීවේ ටඩෙවුස් මාමාගෙන්. දැන් ඒක ස්වභාව ධර්මයෙන්..."සෝයා අඬන්නට වූවා ය.

හරියට ම මේ වේලාවෙහි අම්මා සිටියේ ඇණයක් ගසන්නට තැනක් ලකුණු කරමිනි. සෝයාගේ හැඬුමින් ඇගේ හිත අවුල් විණි. මිටි පහර වැදුණේ දෙගිඩියාවෙන් හුන් ඇයගේ මහපටැඟිල්ලට ය. ඈ කේන්තියෙන් කෑ ගසන්නට වූවා ය.

"ඔයාට කවුරුවත් මොකවත් නොදුන්නොත් කිසි වෙනසක් වෙනවද? උදාහරණෙකට රස කැවිල්ලක්. මගෙන් හරි ජනිනා නැන්දගෙන් හරි නොලැබුණොත්? ඔයාට කොහෙත් ම රස කැවිල්ලක් නෑ."

"ඔයා ගාව තියෙනවද?" සෝයා ඇසුවේ මහත් බලාපොරොත්තුවෙනි. අම්මාට එක් වර ම හිනා ගියේ ය. හිස සෙළැවූ ඈ කාමරයෙන් පිටවූවා ය.

සෝයා කාමරයේ තනිවී කල්පනාවට වැටුණි. ඇයට දැනුණේ කිසිවෙක් ඇයට කිසිවක් නොදුන්නා වැනි හැඟීමකි. ඉතිං ඇයට තද දුකක් දැනුණි. ඈ කළේ තමන්ගේ පොත් පෙට්ටිය ඇද ගැනීම ය. එයින් ඈ එළියට ගත්තේ තමන් ඇඳි චිත්‍රත්, චිත්‍ර පොතක්, පුංචි සටහන් පොතක් යන දේ ය. ටඩෙවුස් මාමා එවූ ලියුම්වල තිබුණු අමුතු වචන ලියා තිබුණේ ඒ පොතෙහි ය. සෝයාට ඇත්තට ම කියවන්නට පිළිවන. එහෙත් ඇයට මේ ලියුම් නම් තේරුණේ නැත. මේ පුංචි පොතේ අඳින ලද චිත්‍ර සටහන් කීපයකුත් තිබුණි. මේවා ඇන්දේ ටඩෙවුස් මාමා ම ය. ඒත් ඒ කුඩාවට ය. ඒවායින් සෝයා විශේෂයෙන් ආශා කළේ කුඩා ළමුන් දෙදෙනාට යි; ඒ අයට තිබුණේ කුඩා වටකුරු මුහුණු, වටකුරු ඇස්, කැරළි ගැසුණු හිසකේ උඩින් තිබුණේ උල් තොප්පි. කෙනෙක්ගේ තොප්පිය අඳුරු තැඹිලි පාට

UNEDITED SAMPLE PAGE



ය, අනෙක් කෙනාගේ එක දීප්තිය අඩු රෝස පාට ය.

සෝයාත් මේ ළමුන් දෙදෙනා තමන්ගේ චිත්‍ර පොතේ ඇඳ තිබුණි. ඈ ඒවාට කළ එක ම වෙනස තොප්පි දීප්තිමත් පාටින් ඇඳීම පමණ ය. එය ඉතාමත් ලස්සන ය, චිත්‍ර ශිල්පියා ඇන්දාටත් වඩා ලස්සන ය... එසේත් නැතිනම් සෝයාට දැනුණේ ඒ ලෙස ය. ඇත්තවශයෙන් ම හුඟාක් හොඳ ය...

"මට හිතාගන්න බෑ මොකක්ද හැබෑට ම මේ උපන්ගෙයි දක්ෂකම කියන්නේ කියලා?..." සෝයා තනිව ම කල්පනා කළා ය. එසේ කල්පනා කරමින් ඈ කොළය උඩ පින්සලය ගෙන ගියා ය.

"එතකොට මොකද මාමා එයින් ටිකක් ඉතුරු නොකර ගියේ? එයාට අමතක වුණා වත්ද? නැත්තං එයා ඕනවට වඩා ලෝබයෙක්ද?"

"අම්මේ ටඩෙවුස් මාමා දැන් කොහේද ඉන්නේ?" අනෙක් කාමරයේ උන් අම්මාගෙන් ඈ ඇසුවේ හඬ නගා කෑ ගසමින්. දැන් ටිකකට කලින් තමා අම්මා සමග තරහ වූ බව ඇයට අමතක වී ගොසිනි.

අම්මා කාමරයේ දොර හරිමින් දියණිය දෙස බැලුවා ය.

"ජනිනා නැන්දා අපට තේ හදලා" අම්මා එසේ කීවේ දුවගේ ප්‍රශ්නය නෑසුනු බව අඟවමින්. එහෙත් ඇයට එය ඉතා හොඳින් ඇසී තිබිණි.

"මේ බලන්න අම්මේ, මට ඇත්ත කියන්න. ටඩෙවුස් මාමා කෝ?"

"ඒකෙන් ඇති වැඩේ මොකක්ද?" අම්මා පිළිතුරු දුන්නේ රළු ලෙසින්.

"ඒත් එයා ජීවත්ව ඉන්නවද තව ම?"

"මේක මතක තියා ගන්න සෝයා..." අම්මාගේ කටහඬ ඇසුණේ බැරෑරුම්ව ය. "චිත්‍ර ශිල්පියෙක් එයාගෙ නිර්මාණවල හැමදා ම ජීවත් වෙනවා. ඔයාට තේරෙනවද?"

"එහෙනං ඒකයි" සෝයා සුසුම් හෙළුවා ය.

"කොයි චිත්‍රයෙද?" ඈ ඇසුවේ සිහින් කෙඳිරියකිනි.

"හැම එකක ම."

"ඔයාගෙ චිත්‍රයෙත්?"

UNEDITED SAMPLE PAGE



"කිසි ම සැකයක් නැතුව."

අම්මා කාමරයෙන් පිටව ගියේ දොර නොවසමිනි. කොරිඩෝරයට ගිය ඈ යළිත් ඇණවලට මිටි පහර දෙන්නට වූවා ය. හැම දෙය ම නියම තැන හැකි ඉක්මනින් සිටුවා, දිගා කොට නැතිනම් එල්ලා තබන්නට ඈ ඉතාමත් ආසා කළා ය. කුස්සිය දෙසින් පාවී ආවේ ගෝවා වෙල්ලවැහුමක පුසුඹකි. ඒත් සෝයා සිටියේ මේසයට හිඳගෙන සිතුවිලි වල අතරමංව ය...

"එහෙනං එහෙමයි ඒක සිද්ධ වෙන්නේ... එහෙමද?... එතකොට? දැන් මං දන්නවා ඇයි ජනිනා නැන්දා හූල්ලන්නේ කියලා ටඩෙව්ස් මාමා ගැන 'එයා අඳින වෙලාවට මුළුමනින් ම තමන්ගේ චිත්‍රෙට ඇලී ඉන්නවා...' කියලා කියන කොට."

චිත්‍ර පොතේ තමන් ඇඳි ළමුන් දෙදෙනා දෙස සෝයා තව වරක් එබී බැලුවා ය. දැන් ඇයට ඔවුන්ගෙන් එතරම් සතුටක් දැනෙන්නේ නැත.

මාමා ඔහුගේ සහජ දක්ෂකම කාහට වත් නොකියා කොහේ හෝ තබා ගියාවත්ද? එසේ නම් ඒ කොහේද? ඈ කල්පනා කළා ය.

ඇය එය ජනිනා නැන්දාගෙන් ඇසිය යුතු ය. සෝයා චිත්‍ර පොත තදින් වසා දමා කුස්සියට දිව ගියා ය. ඒ හා සමග ම....

